# ශිෂ්‍ය නායකයෝ සහ ශිෂ්‍ය ලොක්කෝ




ශ්‍රී ලාංකික අප බොහෝ දෙනෙකු මෙන්ම මම ද වසර දහහතරක් පමණ වූ ඉතා දිගු පාසල් සමයක් ගත කළෙමි. වසර 1968 ජනවාරියේ කොස්සින්න කණිෂ්ඨ විදුහලෙන් ඇරඹී 1981 සැප්තැම්බරයේ කොළඹ ආනන්ද විද්‍යාලයෙන් අස්වීමේ සහතිකය ලබාගන්නා තෙක්වූ ඒ ගමනේ මුල් කාලය තුල කෙසේ වෙතත් පශ්චාත් සමයේදී නම් ශිෂ්‍ය නායකයින් මට නිතර හමුවිය. මගේ ආනන්ද විද්‍යාල දිවියේ අත්දැකීම් මත පදනම් වෙන මේ -පමා නොවී එම් අකුරට" ලිපි පෙලේ අද කොටසින් මා අදහස් කරන්නේ ඒ ශිෂ්‍ය නායකයින් ගැන කතා බහක යෙදෙන්නටයි.

මේ තනතුරුවලට ඔවුන් පත්වෙන ආකාරය සහ පාසල තුල ඔවුන් ක්‍රියාකරන ආකාරය ගැන සලකා බලන කල ශිෂ්‍ය නායකයෝ කිසිසේත්ම සැබෑ නායකයෝ නොවෙතිය යන්න මගේ අදහස බව මුලින්ම කිව යුතුය.

ශිෂ්‍ය නායකයෝ පාසලේ ශිෂ්‍යයින් ගේ ජන්දයෙන්, කැමැත්තෙන් හෝ මනාපයෙන් හෝ පත්වන්නෝ නොවෙති. බොහෝවිට ස්ව-කැමැත්තෙන් ඉදිරිපත් වී හෝ ගුරුවරුන් ගේ තේරීම් අනුව මෙම තනතුරුවලට සලකා බලන ලදුව අවසානයේ ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් ගේ කැමැත්ත පරිදි ඔව්හූ මෙම නායක තනතුරුවලට -පත් කෙරෙති"! ඔවුන් ගේ ක්‍රියා කලාපයේද, කිසිදු නායකත්වයක් පෙන්නුම් නොකරයි. ශිෂ්‍ය නායකයෙකු ගේ ප්‍රධාන වැඩ කොටස සහ වගකීම වන්නේ පොදුවේ විදුහල්පති සහ ගුරු මණ්ඩලයට පාසල පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සහ වාතාවරණය සලසා දීම මිස ශිෂ්‍යයින්ට නායකත්වයක් සැපයීම නොවේ. ශිෂ්‍යයින් ගේ ප්‍රශ්ණ වෙනුවෙන් පෙනී සිටිම ද නොවේ.

මේ තර්කය මා වෙනත් තැනකදී ඉදිරිපත් කළ කල්හි, එයට එරෙහි වූ එක් පාඨකයෙක් මගෙන් ප්‍රශ්ණ කලේ, එසේ නම් අද ලංකාවේ මහජන ජන්දයෙන් පත්වන්නෝ සැබෑ ජනතා නායකයෙ-ද් යනුවෙනි. කිසිදු තර්කයක්, සැකයක්, අනුමා-නයක් නොමැතිව එය සැබෑවකි. ශ්‍රී ලංකාවේ ඉන්නේ ලොක්කෝ මිස නායකයෝ නොවන බව පසුගිය දිනක මිගෙට්ටුවත්තෙ සුමිත්ත හාමුදුරු-වෝ ප්‍රකාශ කර තිබුනේ ද එනිසාය.

මා ආනන්දයේ දහවන ශ්‍රේණියේ ඉගෙනුම අරඹා දෙවන දිනයේම අප පන්තිභාර ගුරුතුමිය විසින් කරන ලද්දේ පන්ති නායකයෙක් පත්කිරීමයි.

පාසල ට නවකයින් වූ අප සියළු දෙනාම, ලංකාවේ මිණුමින්, දුර බැහැර පෙදෙස් වල සිට බස් රථයෙන්, දුම්රියෙන් හෝ පාසලට පැමිණියෝ වීමු. පන්ති නායකකම සඳහා එකම අවශ්‍යතාවය වූයේ නොකඩවා, නොවරදවා, පාසල පටන් ගැනීමට පෙර පැමිණීමට ඇති හැකියාවයි. මක් නිසාද යත්, පන්ති වාර්තා සටහන් පොත, පැමිණීමේ ලේඛණය, හුණු කූරු යනාදිය කාර්‍යාලයෙන් ගෙන ඒම පන්ති නායකයාගේ වග කීම වූ නිසාය. ඒවා ආපසු ගෙනගොස් තැබීමද ඔහු ගේ කාර්යයක් විය. මීට අමතරව උදෑසන රැස්වීම් පැවැත්වෙන දවස් වලදී සිසුන් ඒ දෙසට දැක්කීමද, පන්තියේ පේලියේ මුලින්ම සිට පන්සිල් ගැනීමද පන්ති නායකයා ගේ වැඩ කොටසට අයිති විය.

මේ සියල්ලම නුපුහුණු කම්කරු සහ ආරක්‍ෂක සේවා ක්‍රියා බව පැහැදිලිය. එකම වෙනස නම් වේතන රහිත සේවය-ක් වීමයි.

ඔහු පාසලට පැමිණියේ කොහුවල ප්‍රදේශයේ සිට පාසල් බස් රථයෙන් වුවද, මා මිතුරු සුරේෂ් ජයමාන්න පන්ති නායකයා ලෙස ක්‍රියාකරන්නට මෙදින සිය කැමැත්තෙන් ඉදිරිපත් විය.

පාසලේ ශිෂ්‍ය නායක තනතුරු හෙබවූයේ එකොලොස්වෙනි ශ්‍රේණියේ සහ දෙළොස්වෙනි ශ්‍රේණියේ සිසුන් ය. වසරකට පමණ පසුව අපේ සුරේෂ්ට ද පාලක ගුරුවරුන් ගේ කැමැත්ත පරිදි මේ ශිෂ්‍ය නායක තනතුරක් ලැබුණි. එසේ නමුදු ශිෂ්‍ය නායක වැඩි වශයෙන් පත්වුනේ ඒ ආකාරයෙන් නොව ඒ සඳහා වෙනම අයැදුම් කර කෙලින්ම පත්වීමෙනි. මේ තනතුරු සඳහා විශාල ඉල්ලුමක් ඇති බව කිව යුතු නොවේ.

අපේ කාලයේ දී ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍ය නායක තනතුරකට පත්වීම වනාහී මා දුටු ආකාරයට පණින රිළවුන් ට ඉණිමං දීමකි. ඉබ්බන් දියේ දැමීමකි. නැතහොත් වඳුරන් ට දැලි පිහි දීමකි.

ආනන්දයේ එක් දෙමහල් ගොඩනැගිල්ලක පහල මාලයේ තරමක් සැඟවී ඇති කාමරයක් තිබේ. මෙය ශිෂ්‍ය නායක කාමරයයි. වෙනත් වචන වලින් කිවහොත්, උදෑසන පාසල ඇරඹුණු මොහොතේ සිට අවසාන වන මොහොත දක්වාම සමහර පන්ති නායකයින් තම අගනා කාලය කා දමන ස්ථානයයි.

මා මිතුරෙකු වූ සුජිත් මෙහිදී මට සිහිවේ. අප දෙදෙනා එකම පන්තියේ නොසිටියද, අපි එකට බාහිර ටියුෂන් පන්තිවලට සහභාගී වුනෙමු. එහිදී ද, දුම්රියේ දී හමුවුණු විටද, පාසලේ දී ද නිරතුරු කතාබස් කළෙමු. හදිසියේම, ඔහු ශිෂ්‍ය නායකයෙකු ලෙස පත්වීමක් ලද බව මට පෙණුනේ ඔහු එදින සිට සිය කමිසයේ පළඳින්නට පටන්ගත් කුඩා නිල ලාංඡනය නිසාය.

ඒ සමගම ඔහුගේ චරිතයේ සහ හැසිරීමේ සිදුවුණු පරිවර්තනය නම් ඉතා හොඳින් කැපී පෙනුණි. මුලින්ම ඔහු මා වැනි සාමාන්‍ය ශිෂ්‍යයින් සමග කතාබහ කිරීම අඩුකර දැම්මේය. ඇත්තටම, පාසල පැවැත්වෙන මුළු කාලය තුලම ශිෂ්‍ය නායක කාමරය අසල ගැවසුණු සුජිත් ට අප සමග මිතුරු සමාගමේ යෙදෙනවා තබා තම ඉගෙනීමේ වැඩ කටයුතු වල නිරතවෙන්නටවත් වේලාවක් ඇති බවක් නොපෙනුණි.

මෙහිදී සඳහන් කළ යුතු ඉතාම කණගාටුදයක කාරණය නම් මේ ආකාරයට ශිෂ්‍ය නායකයින් ශිෂ්‍ය නායක කාමරයට වී කාලය කා දමන බව විදුහලේ ආචාර්‍ය මණ්ඩලයට, විනය භාර

***<u>ශිෂ්‍ය නායක කාමරයේ කාලය කා නොදමා තම ඉගෙනීමේ කටයුතු නිසි පරිදි කළ ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබා අද විශේෂඥ වෛද්‍යවරයකු ලෙස කටයුතු කරයි.</u>***

ගුරුවරුන් ට රහසක් නොවීමයි. නමුදු එය වරදක් ලෙස සැලකුණු බවක් කිසිසේත්ම නොපෙණුනි.

ඇත්ත වශයෙන්ම කියනවා නම්, මේ ශිෂ්‍ය නායකයින් හට උසස් පෙල විභාගය උසස් ලෙසින් සමත් වීමට ලොකු අවශ්‍යතාවයක් ද නැත. පාසල් සමය අවසාන වනවාත් සමගම ඔවුන් බොහෝ දෙනෙකුට පෞද්ගලික සමාගම්වල පුහුණුවන කණිෂ්ඨ විධායක තනතුරු සඳහා අවස්ථා ලැබේ. මෙවැනි තනතුරු සඳහා සිරිතක් ලෙස බඳවා ගන්නේ, නගරයේ පාසල්වල කාලය ගත කළ තරුණයින්වය. මා මිතුරු සුජිත් ද විශ්ව විද්‍යාල පාඨමාලාවකට සුදුසුකම් නොලද මුත්, පාසල් සමය අවසන් වී ටික කලකින්ම දුම්කොල සමාගම වැනි තැනක රැකියාවකට ගිය බව සැලවුණි.

මේ ආකාරයට සලකා බලන කළ ආනන්දය වැනි පාසලක ශිෂ්‍ය නායක තනතුරක් ලැබීම වනාහී අධ්‍යාපනය සම්බන්ධයෙන් එක්තරා මට්ටමක මර උගුලක් බව පෙනී යයි.

එයින් මිදුණු අය මා දන්නේ කීප දෙනෙක් පමණි. එද පාසලට නිතිපතා කල් ඇතුව පැමිණීමේ වගකීම බාරගත් නිසා පන්ති නායක කම ලබා පසුව පාසලේ ශිෂ්‍ය නායකයෙකු වූ මා මිතුරු සුරේෂ් ජයමාන්න ඉන් එක් අයෙකි. ශිෂ්‍ය නායක කාමරයේ කාලය කා නොදමා තම ඉගෙනීමේ කටයුතු නිසි පරිදි කළ ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබා අද විශේෂඥ වෛද්‍යවරයෙක් ලෙස කටයුතු කරයි.

මා නොබොද ඇසූ පහත සඳහන් කුඩා කතාවෙන් අද මේ ලිපිය අවසන් කිරීමට කැමැත්තෙමි. පසුගිය ද මා මිතුරෙකු ට ලඟදී ශ්‍රී ලංකාවේ සිට පැමිණි තරුණයෙක් හමුවිය.

"මල්ලී කොයි ඉස්කෝලෙද ස්ටඩි කලේ?" මා මිතුරා කළ විමසුමට ලැබුණු පිළිතුර මෙලෙස විය.

"ස්ටඩි කළා කියල නම් කියන්න බෑ. මං ගියේ නම් ,,,, කොලේජ් එකටයි!"

**Four Story Building in Negombo Main Street**

This building is bordering the Main Street and
Udarthoppuwa Road
2200 sq feet in extent.
Floor to floor area 6500sq feet
Provisions to go up to 8500 sq feet

**Monthly income in the range of Rs175000.00**
**Expected amount 50million Sri lankan rupees**

Details
**Menaka 94027093/0434021076**

